# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2015

## 2020 පෙබරවාරි - අප්‍රේල්

## මානවශාස්ත්‍ර පීඨය

## බටහිර සම්භාව්‍ය සංස්කෘතිය

## ග්‍රීක හා රෝම කලාව හා පුරාවස්තු WCCU E - 1025

ප්‍රශ්න සංඛ්‍යාව : 8 යි. කාලය : පැය 03 යි.

---

1. ආකේක යුගයේ (Archaic) ප්‍රතිමා කලාව තුල මිනිස් සිරුරේ ස්වභාවය හා අංග චලන කොතරම් තාත්විකව නිරූපනය වී ඇත්ද ? සාකච්ඡා කරන්න.

2. ආකේක හා සම්භාව්‍ය යුගයන්හි ( Classical) ග්‍රීක මැටි බඳුන්වල ස්වභාවය හා ප්‍රමාණය ඒවා භාවිතා කිරීමට හේතු වූ සමාජීය හා ආගමික අවශ්‍යතා කෙසේ සපුරන්නට ඇත්දැයි සාකච්ඡා කරන්න.

3. සම්භාව්‍ය යුගයේ ග්‍රීක දෙවොලක ගෘහනිර්මාණ අංග නිරූපනය කිරීමේ ලා ග්‍රීක ගෘහනිර්මාණ ශිල්පියාගේ ශිල්පීය දැනුම කොතරම් ප්‍රබලව දායක වී ඇත්ද ? සාකච්ඡා කරන්න.

4. එක්කෝ සම්භාව්‍ය යුගයේ ග්‍රීක දේවවාක්‍ය (Oracles) නැත්නම් ග්‍රීක අනාවැකි පළකිරීමේ ක්‍රම (divination ) වල ආගමික වැදගත්කම සාකච්ඡා කරන්න.

5. රෝම සමූහාණ්ඩුවේ (Republic) ආගමික උත්සවවල එක්කෝ සශ්‍රීකත්වය (fertility) නැත්නම් මිය ගිය ඥාති වන්දනය (worship of dead ancestors) කෙසේ සංකේතවත් කර ඇත්ද ? සාකච්ඡා කරන්න.

6. ගුප්ත ඇදහිලි (mystery cults) එක්කෝ සම්භාව්‍ය හා හෙලනිස්තික (Hellenistic) යුගයන්හි ග්‍රීසියේ නැත්නම් සමූහාණ්ඩු හා අධිරාජ්‍ය (Empire) යුගයන්හි රෝමයේ මරණින් මතු ජීවිතය පිළිබඳ අදහස් කෙරෙහි කෙසේ දායක වූවාද ? සාකච්ඡා කරන්න.

7. සම්භාව්‍ය යුගයේ ග්‍රීකයන්ගේ සෞඛ්‍යසම්පන්න බව හා සමාජීය එකමුතුව පවත්වාගෙන යාමෙහිලා ක්‍රීඩාව කොතරම් වැදගත් වූවාද ? සාකච්ඡා කරන්න.

8. පහත මාතෘකාවන්ගෙන් දෙකකට (02) කෙටි සටහන් සපයන්න.
    1. ප්‍රැක්සිටලීස් (Praxiteles)
    2. හේඩීස් ( Hades)
    3. හෙටයිරායි (Hetairae)
    4. මර්කරි (mercury)
    5. රෝම පූජකවරු (Roman Priests)

********************